
# පාත්ෆයින්ඩර් සැලසුම් වෙබ් අඩවියට



**පාත්ෆයින්ඩර්** පදනම 2018 වසරේ අලුත් සැලසුම් අනුව යමින් පදනමට අනුබද්ධිතව සාගර නීති මධ්‍යස්ථානයක් ස්ථාපිත කරයි. ඉන්දිය සාගර කලාපය පරිහරණය කරන රටවල් හා වෙළෙඳ ව්‍යාපාර වෙනුවෙන් කිසියම් ආචාර ධර්ම පද්ධතියක් ඇති කළ යුතු බව මෙරට සහ ජාත්‍යන්තර අවධානයට යොමු වී ඇත. හැසිරවීමේ පාලන අදහස්වලින් යුතු කාලීන යෝජනාවලියක් අලුතින් පිහිටුවන ලද සාගර නීති මධ්‍යස්ථානය සකස් කර ඇති අතර එය මහජන අදහස් ලබා ගැනීම අරමුණු කරගෙන කෙටුම් පතක් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබේ.

පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා එම කෙටුම්පත වෙබ් අඩවියට ඇතුළත් කරන ලද අවස්ථාව ඡායාරූපයෙහි දැක්වෙයි. සාගර නීති මධ්‍යස්ථානයේ සභාපති බර්නාඩ් ගුණතිලක, අධ්‍යක්ෂිකා ආචාර්ය අද්මිරාල් ජයනාත් කොළඹගේ, අධ්‍යක්ෂ ලක්ෂමන් සිරිවර්ධන ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

ඉන්දියන් සාගරය ආශ්‍රිතව පිහිටි රටවල් විසි එකක් මෙම ආචාර ධර්මවලින් සමන්විත පාලන සම්මුතියක් අවශ්‍ය බව දීර්ඝ කාලයක් තිස්සේ පෙන්වා දෙමින් සිටින අතර නව කෙටුම්පත ජාත්‍යන්තරව ඒ සම්බන්ධයෙන් පවතින නූතන විධිවිධාන ඇසුරු කරගෙන සකස් කර තිබේ. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා 2017 මාර්තු මාසයේ ජකර්තා නුවර දී පැවැති සමුළුවකදීය. අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේ කොළඹ දී පැවැති ඉන්දියන් සාගර දෙවැනි සමුළු වාරයේදී ද මෙවැනි පාලන සම්මුතියක අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

www. pathfinder. org වෙබ් අඩවියෙන් එය කියවිය හැකිය.